# HSBC Advance

## කෙටි විස්තරය

| සැලසුමෙහි විශේෂාංග | | වැඩි විස්තර සඳහා |
|---|---|---|
| **යෝග්‍යතාව** | • රු.500,000/-ක අවම මාසික සමස්ත සබඳතා ශේෂයක් තනි ස්ථාවර තැන්පතු වල තැන්පත් කර පවත්වා ගැනීම.<br>• රු.100,000/-ක හෝ ඊට ඉහළ අවම මාසික වැටුපක් ප්‍රේෂණය කිරීම. | •www.hsbc.lk/advancetnc |
| **HSBC Advance ප්‍රතිලාභ සැකෙවින්** | • HSBC Rewards / Visa Platinum Cashback ක්‍රෙඩිට් කාඩ්පතක් නොමිලේ.<br>• HSBC Advance Visa Platinum ඩෙබිට් කාඩ්පතක් සහ දිවයින පුරා ඕනෑම Plus ATM යන්ත්‍රයකින් මුදල් ආපසු ගැනීම් නොමිලේ.<br>• අයිරා පහසුකම්.<br>• HSBC Advance ජංගම ගිණුමක් සහ ඉතුරුම් ගිණුමක්.<br>• ස්ථාවර තැන්පතු මත අනුග්‍රහපූර්වක පොලී අනුපාතිකයන්.<br>• බැංකු සැලසුම් සහ සේවා සඳහා අනුග්‍රහපූර්වක ගාස්තු ලේඛන අයකුම.<br>• අන්තර්ජාල බැංකුකරණ සහ දුරකථන බැංකුකරණ පහසුකම් නොමිලේ.<br>• ක්‍රෙඩිට් කාඩ්පත සඳහා වසර පුරා පිදෙන විශේෂ වරප්‍රසාද.<br>• Global view / Global Transfer (විදේශ විනිමය රෙගුලාසි වලට යටත් ව).<br>• ජාත්‍යන්තර ගිණුම් විවෘත කිරීමේ දී සහය<br><br>*පුද්ගලික වෙබ් සර්වරයේ (PWS) ඉහත ප්‍රතිලාභ පිළිබඳ වැඩි විස්තර දක්වා ඇති පිටුව වෙත සබැඳිය ලබාදෙන්න. | •www.hsbc.lk/advance |

## මූල්‍ය

| | | |
|---|---|---|
| **ශේෂය අවම ශේෂයට වඩා අඩු වූ විට ගාස්තුව** | • වේතනික සැලසුම (payroll proposition) යටතේ යෝග්‍යතා සුදුසුකම් පවත්වාගෙන නොයන්නේ නම්, **රු.1,500/-ක මාසික සේවා ගාස්තුවක්** අය කෙරෙනු ඇත. | •www.hsbc.lk/tariffs |
| **ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා ගාස්තු** | • මූලික සහ ද්විතීයික Rewards / Visa Platinum Cashback ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා වාර්ෂික ගාස්තු හා සම්බන්ධවීමේ ගාස්තු අත්හරිනු ලැබේ. | |
| **ATM වෙතින් මුදල් ආපසුගැනීම් සඳහා ගාස්තු** | • HSBC දේශීය/විදේශීය ශාඛාවල දී (PLUS), වෙනත් දේශීය බැංකු ATM යන්ත්‍ර වෙතින් සිදුකරන සියලු මුදල් ආපසුගැනීම් නොමිලේ. | |
| **වෙනත් ගාස්තු** | • තෝරාගත් බැංකුකරණ සේවාවන් සඳහා ගාස්තු අත්හැරීම් හෝ අනුග්‍රහපූර්වක පිරිනැමීම් රැසක්. ගාස්තු සහ අයකිරීම් පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර, HSBC වෙබ් අඩවියෙන් ලබාගත හැකි, “HSBC ගනුදෙනුකරුවන් සඳහා වන බැංකුකරණ ගාස්තු අයකුම ලේඛනය” බලන්න. | |



PUBLIC

# HSBC Advance

| කෙටි විස්තරය | | |
| --- | --- | --- |
| ප්‍රධාන නීති | | වැඩි විස්තර සඳහා |
| **HSBC Advance** **සඳහා යෝග්‍යතාව** | • HSBC Advance සඳහා වන විශේෂාංග සහ ප්‍රතිලාභ භුක්ති විඳීම පිණිස HSBC Advance සඳහා වන යෝග්‍යතා සුදුසුකම් සහ වෙනත් අදාළ නීතිරීති ඔබ විසින් සපුරාලිය යුතු වේ. | |
| **යෝග්‍යතා සුදුසුකම් වෙනස් කිරීම** | • ඇතුළත්වීමේ යෝග්‍යතා සුදුසුකම් කලින් කලට වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතු වන අතර, එවැනි සංශෝධන HSBC පොදු වෙබ් අඩවියෙහි සහ සියලු ශාඛාවන් හි වෙනත් පොදු ස්ථානවල ප්‍රදර්ශනය කෙරෙනු ඇත. | |
| **හවුල් ගිණුම්** | • Advance නීතිරීති සහ කොන්දේසි යටතේ වඩාත් පැහැදිලිව විස්තර කර ඇති පරිදි, අදාළ ගිණුම, සේවා හෝ අන් ආකාරයේ බැඳීම් හා වගකීම් සම්බන්ධයෙන් ඔබ, එක් එක් හවුල් ගිණුම් හිමියන් ද සමග එක් ව හා වෙන් වෙන් ව බැඳී සිටියි. | |
| **ගාස්තු** | • අදාළ අවස්ථාවන් හි දී කලින් කලට සේවා ගාස්තු, පහසුකම් ගාස්තු හෝ වෙනත් ගාස්තු පනවනු ඇත.  ගාස්තු සහ අයකිරීමේ "HSBC ගනුදෙනුකරුවන් සඳහා වන බැංකුකරණ ගාස්තු අයකුම ලේඛනය" හි ප්‍රකාශයට පත් කෙරෙන අතර, HSBC වෙබ් අඩවිය වෙතින් ලබාගත හැකිය. | |
| **කාල තැන්පතු සහ ඉතුරුම් සැලසුම් සඳහා වන පොලී අනුපාතිකයන්** | • ඉතුරුම් සහ කාල තැන්පතු ගිණුම් (විදේශ ව්‍යවහාර මුදල්/දේශීය ව්‍යවහාර මුදල්) සඳහා වූ පොලී අනුපාතික පූර්ව දැනුම්දීමකින් තොරව වෙනස්වීමට විෂය වේ.  කෙසේ වෙතත්, පවත්නා කාල තැන්පතු මත ගිවිස ගනු ලැබූ පොලී අනුපාතික, එම තැන්පතු කල් පිරෙන තෙක් අප විසින් වෙනස් කරනු නොලැබේ. | |
| **ණය සහ සියලු වත්කම් සැලසුම් සඳහා වන පොලී අනුපාතිකයන්** | • සියලු ණය සැලසුම් සඳහා වන පොලී අනුපාතිකයන් වෙළඳපොළ පොලී අනුපාතිකයන්ට අනුව බැංකු විසින් තීරණය කරනු ලබන පරිදි කලින් කලට වෙනස්වීම්වලට විෂය වේ. අපගේ පරිශ්‍රයන් හි සහ/හෝ HSBC පොදු වෙබ් අඩවියේ සහ/හෝ ප්‍රකාශන පණිවුඩයක් මඟින් සහ/හෝ වෙනත් සුදුසු ඕනෑම ආකාරයකට ප්‍රදර්ශනය කිරීම මඟින් පොලී අනුපතිකයන්ගේ වෙනස්වීම් ඔබ වෙත දැනුම් දෙනු ඇත. | |
| **ඔබේ තොරතුරු භාවිතය** | • කිසියම් අතිරේක සේවාවක් ඔබ වෙත සැපයීම සලකා බැලීමට හැකිවන පරිදි ඔබගේ පුද්ගලික තොරතුරු කලින් කලට අප වෙත සැපයීමට ඔබට සිදුවනු ඇත.  පුද්ගලික තොරතුරු සඳහා ප්‍රවේශවීමේ හා ඒවායින් කිසිවක් නිවැරදි කිරීමේ අයිතිය ඔබ සතු වන අතර, ඍජු අලෙවිකරණ කටයුතු සඳහා ඔබගේ පුද්ගලික තොරතුරු භාවිත නොකරන ලෙසට ඉල්ලා සිටීමට ද ඔබට හැකිය. | |
| **ඔබේ ගිණුමට හර කිරීමට; හිලව් කිරීමට අපට ඇති අයිතිය** | ඔබ වෙත පූර්ව දැනුම්දීමකින් තොරව පහත සඳහන් කටයුතු කිරීමේ අයිතිය අප සතුය:<br>• අප වෙත ඔබ විසින් ගෙවිය යුතුව ඇති ඕනෑම මුදලක් අප සමග ඔබ විසින් පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකින් හර කිරීමට;<br>• අප සමග ඔබ විසින් පවත්වාගෙන යනු ලබන ඕනෑම හෝ සියලුම ගිණුම්වල ශේෂයන් රඳවා තබාගැනීමට, සංයුක්ත කිරීමට, ඒකාබද්ධ කිරීමට සහ එවැනි ගිණුම්වල බැර වී පවතින යම් මුදලක් හෝ ඔබ විසින් අප වෙත ගෙවිය යුතුව පවතින (ඔබ විසින් තනිව හෝ වෙනත් යම් අයෙකු සමග හවුල් ව හෝ ගෙවිය යුතුව පැවතිය ද) මුදලක් එකී වගකීම් සත්‍ය හෝ අභඹු වුවද, වර්තමාන හෝ අනාගත වුවද, පියවීම හෝ මාරුකිරීම ද සිදුකළ හැකිය; සහ<br>• අප සමග පවත්වාගෙන යනු ලබන ඔබගේ කිසියම් හෝ සියලුම ගිණුම් වල ඕනෑම ව්‍යවහාර මුදලකින් බැරට පවතින ඕනෑම මුදලක්, ගෙවීමට නියමිතව පවතින හෝ ඔබ විසින් ඉල්ලා සිටි විටෙක හෝ, ඔබ විසින් අප වෙත ණයව පවතින යම් මුදලකට වඩා එකී මුදල අඩු වේ නම්, එකී මුදල් ඔබ වෙත ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට. | |

# HSBC Advance

## කෙටි විස්තරය

| ප්‍රධාන නීති | | වැඩි විස්තර සඳහා |
|---|---|---|
| **සේවාවන් හෝ ගිණුම් අවසන් කිරීම** | • පූර්ව ලිඛිත දැනුම්දීමක් අප වෙත ලබාදීම මගින් අපගේ සේවාවන් හෝ ඔබගේ ඕනෑම ගිණුමක් අවසන් කිරීමට ඔබට සිදුකළ හැකිය.<br>• ඔබ වෙත පූර්ව දැනුම්දීමකින් තොරව අපගේ සේවාවන් සියල්ලම හෝ ඒවායින් යම් කොටසක් හෝ ඔබ වෙත පූර්ව දැනුම්දීමක් සහිතව ඔබගේ යම් ගිණුමක් අවසන් කිරීම හෝ අප විසින් සිදුකළ හැකිය.<br>• එකඟ වූ යෝග්‍යතා සුදුසුකම් මාස තුනක් අඛණ්ඩව ඔබ විසින් පවත්වාගෙන නොගිය විටෙක ඔබේ HSBC Advance ගිණුම් පැකේජය, පවත්නා නීතිරීති සහ කොන්දේසි වලට අනුව සාමාන්‍ය බැංකුකරණ ගිණුමක් බවට හරවනු ලබන අතර, වේතනික සැලසුම (payroll proposition) යටතේ ගිණුම් හිමියා විසින් භුක්ති විඳින ලද HSBC Advance ගිණුම් පැකේජයේ සියලුම වරප්‍රසාද ඒ අනුව අත්හිටුවනු ලැබේ. ඔබ TRB ගනුදෙනුකරුවෙකු නම්, ගිණුම හිලව් කිරීමේ ලිපියෙහි දක්වා ඇති සුරක්ෂිත ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා වන නීතිරීති සහ කොන්දේසි මෙන්ම Advance නීතිරීති සහ කොන්දේසි ද අදාළ වනු ඇත. | |
| **නීතිරීති සහ කොන්දේසි වෙනස් කිරීම** | • නීතිරීති සහ කොන්දේසි කලින් කලට වෙනස් කිරීම සඳහා වූ අයිතිය අප සතු වන අතර, HSBC පොදු වෙබ් අඩවියෙහි හෝ අප විසින් සුදුසු යැයි තීරණය කරන ඕනෑම ආකාරයක් මගින් ඒ බව ඔබ වෙත දැනුම් දෙනු ලැබේ. | |

## ඔබේ හඬ

ඔබේ ප්‍රතිචාර සහ පැමිණිලි අප වෙත දැන්වීමට කැමැති නම්, කරුණාකර අප අමතන්න.

තැපැල් ලිපිනය : කළමනාකරු, පාරිභෝගික අත්දැකීම් සහ සබඳතා, පාරිභෝගික බැංකුකරණ සහ වත්කම් කළමනාකරණය, අංක 163, යුනියන් පෙදෙස, කොළඹ 02
පාරිභෝගික විසඳුම් ක්ෂණික ඇමතුම් : +94 114 511 566
විද්‍යුත් තැපැල් : customersolutions@hsbc.com.lk
වෙබ් අඩවිය : www.hsbc.lk/advance

අප වෙත මතු කරන ඕනෑම කරුණක් ඔබ පූර්ණ වශයෙන් සතුටට පත්වන ආකාරයට විසඳීමට අප කැමති වන අතරම, මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යාලය වෙත ලිපියක් ලියා ප්‍රතිකර්මයක් ඉල්ලා සිටීම ද ඔබට සිදුකළ හැකිය. ඔම්බුඩ්ස්මන්වරයා සමග සම්බන්ධවීමේ තොරතුරු පහත දැක්වේ:

තැපැල් ලිපිනය - ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය, 143ඒ, වජිර පාර, කොළඹ 5.
දුරකථන : +94 112 595 624
ෆැක්ස්: +94112595625
විද්‍යුත් තැපැල් : info@financialombudsman.lk
වෙබ් අඩවිය : www.financialombudsman.lk

- මෙම වගුවෙහි දැක්වෙන්නේ දැනගැනීම සඳහා වන මූලික සැලසුම් සම්බන්ධ නීතිරීතිවල සාරාංශයක් පමණක් වන අතර, Advance සැලසුම් සඳහා වන සම්පූර්ණ නීතිරීති සහ කොන්දේසි මෙමගින් ආවරණය වන බවක් අදහස් නොකෙරේ. කිසියම් අනනුකූලතාවක් ඇති වුවහොත්, Advance සඳහා වන සම්පූර්ණ නීතිරීති සහ කොන්දේසි බලපැවැත්වෙනු ඇත.

- මෙම ප්‍රධාන නීතිරීතිවල සාරාංශයෙහි ඉංග්‍රීසි සහ දමිළ පරිවර්තනයන් www.hsbc.lk වෙබ් අඩවියෙන් ද, මුද්‍රිත පිටපත් බැංකුවේ සියලු කාර්යාල සහ/හෝ ශාඛා කාර්යාවලින් ලබාගත හැක. මෙම ප්‍රධාන නීතිරීතිවල සාරාංශයෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට ඉංග්‍රීසි භාෂා පාඨය බලපැවැත්වෙනු ඇත.